සබරගමුව පළාත් ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු සවිය 2026

5 ශ්‍රේණිය

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගයට සූදානම් වන පහ ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය

ප්‍රශ්න පත්‍ර අංක 01

II පත්‍රය

කාලය පැය 01 යි මිනිත්තු 15 යි

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

විභාග අංකය : .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් -

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. සමහර ප්‍රශ්නවල අනු කොටස් ද ඇත.
* **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවල **තිත් ඉරි මත** පිළිතුරු ලියන්න.
* පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
අවසාන ලකුණු	
එකතුව ඉලක්කමෙන්	
එකතුව අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි.	V/II/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර , ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව සහතික කරමි.	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	V/II/S/CH

ලබා දෙන දිනය - 2026.02.11 පෙ.ව. 9.30 සිට පෙ.ව. 10.45 [දෙවැනි පිටුව බලන්න.

01. පහත ඡේදය කියවා පිළිතුරු ඡේදය ඇසුරෙන් ම ලියන්න.

> අතීතයේ රජ කළ බොහෝ රජවරුන් වැව් සාදා තිබේ. මෙම වැව් ගොවිතැනට බොහෝ උදවු සපයයි. මේවා මඟින් ගොවිතැනට අවශ්‍ය ජලය සැපයීම කරනු ලබයි. වැව් යනු කෘෂි කර්මාන්තයට අත්‍යාවශ්‍ය දෙයකි. වැව් ඒ තරමට ම කෘෂි කර්මාන්තය හා බද්ධ වී පවතී. වර්ෂාව නොමැති කාලවල වැව්වල ඇති ජලයේ වටිනාකම කියා නිම කළ නොහැකිය. වැව් අනාගතයට ද සුරක්ෂිත ව තබා ගැනීම අප සතු වගකීමකි.

1. වැව් සාදා ඇත්තේ කවුරුන් ද? .....
2. මෙම වැව් බොහෝ සේ උදවු කරන්නේ කුමකට ද? .....
3. වැව් මඟින් කරනු ලබන්නේ කුමක් ද?.....
4. මෙම වැව් කුමක් හා බද්ධව පවතී ද? .....
5. අප සතු වගකීම කුමක් ද? .....
6. මූර්ධජ අක්ෂරයක් සහිත වචනයක් ඡේදයෙන් සොයා ලියන්න. .....

02. ඒක වචන අතීත කාල ක්‍රියා පදය තෝරා යටින් ඉරක් අඳින්න.

1. බලයි 2. නැටුවෝ ය 3. කැඩුවේ ය

03. පහත සඳහන් එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

1. නංගිලා ඉද්ද මල් කැඩුවෝ ය. ( )
2. ගංගා පහළට ගලා බසිති. ( )
3. අපි ක්‍රීඩා තරගයට සහභාගී වෙති. ( )
4. අම්මා කිරිබත් ඉව්වා ය. ( )
5. අක්කලා ජනකවි තරගයෙන් ජය ලබා ගත්හ. ( )

04. දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍යක් ලියන්න.

ගිරා / බටිති / ගුවනේ / කරති / මලිති / සමූහය / කුරුලු / පියාසර / නිල් / ආදී

.....

05. පහත එක් එක් ප්‍රශ්නයෙහි නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

1. ආපන ශාලාව, ආපණ ශාලාව, ආපන ෂාලාව
2. වලාකුළු, වළාකුළු, වලාකුලු

06. ගැළපෙන විරාම ලකුණු යොදන්න.

අපි ඩෙංගු උවදුර පිටුදකිමු මාතෘකාවට අදාළව වැකි ලියමු

විභාග අංකය : .....

07. පහත සඳහන් වාක්‍යය වර්තමාන කාලයට හරවා ලියන්න.

ගෙවිලියෝ ගොයම් කැපුවෝ ය.

.....

08. පහත සඳහන් අවස්ථාවට ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

අනුන් රවටන්නට ගොස් තමන් රැවටීම.

.....

09. පහත ඉඟි වැකියෙහි අදහස ලියන්න.

අකුරක් නැර - .....

10. පහත සඳහන් පදවලට ගැළපෙන විරුද්ධාර්ථ පදය ලියන්න.

1. අවසානය - ..... 2. ප්‍රශ්න - .....

11. ගැළපෙන යුගල පදය ලියන්න.


..... සෙල්ලම්


(ලකුණු 26)

12. එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

1. Rainbow - ..... 2. Pumpkin - .....

13. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.





14. පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

1. do / like / What / you

.....

2. am / mango / I / eating

.....

15. "කාල්" යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න. .....

16. පහත සඳහන් වාක්‍ය දෙමළ බසින් කියන ආකාරය සිංහල වචනවලින් ලියන්න.

මම එළියට යන්න ද? - .....

(ලකුණු 8)

➢ **පහත සඳහන් ප්‍රශ්න සියල්ලට ම අදාළ පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

17. 1. පහත සඳහන් සංඛ්‍යාංකයේ සංඛ්‍යා නාමය ලියන්න.

28945	⟶	.....

2. පහත සඳහන් සංඛ්‍යා නාමයේ සංඛ්‍යාංකය ලියන්න.

දහ අටදහස් පහ - .....

18.

9	3
8	2

කොටුව තුළ ඇති සියලු ම ඉලක්කම් යොදාගෙන 2 ඉලක්කමෙන් නිරූපිත අගය 200 ද, 9 ඉලක්කමෙන් නිරූපිත අගය 90 ද වන ඉලක්කම් හතරේ සංඛ්‍යා දෙකක් ලියන්න.

1. ..... 2. .....

19. පහත සඳහන් සංඛ්‍යා අවරෝහණ පටිපාටියට ලියන්න.

9264, 9345, 9624 - .....

20.


එක්තරා පාසලක ගැහැනු ළමයි 2689 ක් ද පිරිමි ළමයි 2825 ක් ද සිටිති.

1. පාසලේ සිටින මුළු ළමයි සංඛ්‍යාව කීය ද? .....

2. එම පාසලේ ගැහැනු ළමයින්ට වඩා සිටින පිරිමි ළමයි සංඛ්‍යාව කොපමණ ද?

.....

21.



මෙම රූපයේ 1/4 ක් අඳුරු කර ඇත.

1. මෙම රූපයේ තවත් 2/4 ක් අඳුරු කර දක්වන්න.
2. දැන් මුළු රූපයේ අඳුරු කර ඇති කොටස භාග සංඛ්‍යාවක් ලෙස දක්වන්න.

.....

22. පහත සංඛ්‍යා රටාවන්හි හිස්තැන්වලට සුදුසු සංඛ්‍යාව බැගින් ලියන්න.

1. 124, 131, 138, ..., 152 2. ....., 185, 190, 195, 200

23. ළිඳක් කැපීමට දින දෙකක් ගත විය. පළමු දිනයේ 4m 85cm ක් ගැඹුරට ද දෙවැනි දිනයේ දී 4m 65cm ක් ගැඹුරට ද කපන ලදී. දින දෙක අවසානයේ දී ළිඳ කොපමණ ගැඹුරකට කපා තිබේ ද?

.....

24. කුමාරි තෑගි දීම සඳහා පොත් 675 ක් ගෙන එම පොත් 4 බැගින් පාර්සල් කරන ලදී.

1. පොත් 4 බැගින් වූ පාර්සල් ගණන කීය ද? .....

2. තවත් එවැනි පාර්සලයක් සැකසීමට ඉතුරු පොත් ගණනට තව පොත් කීයක් අවශ්‍ය ද? .....


25. 1. පහත බිල්පත සම්පූර්ණ කරන්න.

ද්‍රව්‍ය	මිල දී ගත් ප්‍රමාණය	1kg ක මිල		වටිනාකම	
		රුපියල්	සත	රුපියල්	සත
හාල්	3kg	240	00	.....	.....
පරිප්පු	.....	320	00	160	00
අල	250g	.....	.....	50	00
			මුළු මුදල	.....	.....


2. බිල්පත සඳහා රුපියල් 1000 ක මුදලක් දුන්නේ නම් ලැබෙන ඉතුරු මුදල කීය ද?

.....

26. 1. පහත රූපයේ සමමිතික අක්ෂ 2 ක් පමණක් අඳින්න.




2. පහත ඝනවස්තුවේ නම ලියන්න.



.....


3. පහත හැඩතලයේ නම ලියන්න.



.....

27. එක් සිසුවෙකුට බිස්කට් 5 බැගින් චාරිකාවට සහභාගී වන සිසුන් 94 දෙනෙකුට බෙදා දීමට බිස්කට් කීයක් අවශ්‍ය වේ ද? .....


28.



මාළු ටැංකියේ සිටින මාළු සංඛ්‍යාව රෝම සංඛ්‍යාංකයෙන් ලියන්න.

.....

29.



පැයක් තුළ මාර්ගයේ ධාවනය වූ වාහන පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරයේ දැක්වේ.

1. මාර්ගයේ ගමන් කළ යතුරු පැදි ගණන 8 කි. එය ප්‍රස්තාරයේ ඇඳ දක්වන්න.

2. පැයක් තුළ ගමන් කළ මුළු වාහන ගණන කීය ද? .....

(ලකුණු 30)


➢ **අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

30. රාජ්‍ය ලාංඡනයේ ඉර හඳ දෙකෙන් පිළිඹිබු වන්නේ,

1. සෞභාග්‍ය හා පරිපූර්ණ බව
2. සදාතනික බව
3. ස්වයංපෝෂිත බව හා සශ්‍රීකත්වය

31. අනාරක්ෂිත අවස්ථාවක් නොවන්නේ,

1. රතිඤ්ඤා පත්තු කිරීම.
2. දුම්රිය මාර්ගයේ ගමන් කිරීම.
3. අලි ඇතුන් ගමන් කරන මාර්ගයක්

32. 

මෙම රූපයේ දැක්වෙන්නේ,

1. ආචාර්ය ටී. බී. ඡයා මහතා
2. මහාචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතා
3. ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා

33. 4 ශ්‍රේණියේ සිසුවකු චුම්බක දෙකක් මේසය මත තැබූ අයුරු මෙසේ ය.

1. විකර්ෂණය වේ.
2. ආකර්ෂණය වේ.
3. ආකර්ෂණය හා විකර්ෂණය වේ.

S	N

S	N

34. අවුරුද්දේ එක් කාලයකට පමණක් මල් පිපෙන ශාකයකි.

1. වද
2. කෙසෙල්
3. බිනර

35. යම් කාර්යයක් නියමිත කාලය තුළ ඉටු කිරීමෙන් සිදුවන වාසියකි.

1. මානසික පීඩනය දැනීම.
2. තමා පිළිබඳව අභිමානයක් ඇති වීම.
3. කාර්යය පිළිවෙළට අවසන් කරගත නොහැකි වීම.

36. පුස්තකාලය තුළ දී නිවැරදි හැසිරීමකි.

1. නිශ්ශබ්දව අන් අයට බාධා නොවන සේ හැසිරීම.
2. ශබ්ද නඟන සේ කතා කිරීම.
3. රාක්කවල ඇති පොත් අපිළිවෙළට තැබීම.

37. ජාතික කොඩියේ ඇති වර්ණ වන්නේ,


1. තැඹිලි, කොළ, දම්, නිල්
2. රතු, නිල්, කොළ, කහ
3. රතු, කහ, කොළ, තැඹිලි

38. ශ්‍රී ලංකාවේ උස ම කන්ද වන්නේ,

1. කිරිගල්පොත්ත
2. පිදුරුතලාගල
3. බඹරකන්ද

39. නා මලට සහ සල් මලට ඇති පෙති ගණන පිළිවෙළින්,

1. 4 සහ 6
2. 5 සහ 4
3. 5 සහ 6

40. 

මෙම රූපය අයත් පළාත හා දිස්ත්‍රික්කය පිළිවෙළින්,

1. උතුරු මැද පළාත, අනුරාධපුර දිස්ත්‍රික්කය
2. මධ්‍යම පළාත, මාතලේ දිස්ත්‍රික්කය
3. මධ්‍යම පළාත, මහනුවර දිස්ත්‍රික්කය

41. වේළීමෙන් හා වැලි යට දැමීමෙන් කල් තබා ගත හැකි ආහාරයකි.


1. සියඹලා
2. දෙහි
3. ගොරකා

42. වඳුරෙකුගේ ගමන් විලාසය ගැන කියවෙන වන්නමකි.

1. ගජගා වන්නම
2. හනුමා වන්නම
3. මුසලඩි වන්නම

43. ලේන්සුවක මලක්, නටුව සහ පත්‍රය වටේ මැසීමට උදවු වන මැහුම් ක්‍රමයකි.

1. බ්ලැන්කට් මැස්ම
2. දම්වැල් මැස්ම
3. කතිර මැස්ම

44. 

ගෙවත්තට එන සතුන් පලවා හරින මෙම උපකරණය කුමක් ද?

1. සුළං බඹරය
2. සුළං ටකය
3. බඹර පෙත්ත

45. "ඉර දෙවියන්ගේ ඉර ගල ගාවා" මෙම කවිය,

1. පැල් කවි
2. ගොයම් කවි
3. පතල් කවි




46. අඩුවෙන් ජලය පානය කිරීමෙන් අපේ සිරුරේ ඇතිවන තත්ත්වයක් නොවන්නේ,

1. උගුර කට වේළීම.
2. මුත්‍රා කිරීමේ පහසුව
3. මුත්‍රාවල තද පැහැය ගැනීම.

47. මහා ශිව රාත්‍රිය සහ හජ්ජි උත්සවය සමරන ආගමික බැතිමතුන් පිළිවෙළින්,

1. ඉස්ලාම් සහ හින්දු බැතිමතුන්
2. හින්දු සහ ඉස්ලාම් බැතිමතුන්
3. බෞද්ධ සහ කතෝලික බැතිමතුන්

48. සිදුරු කැමරාවකින් බැලූ විට ගසක් පෙනෙන නිවැරදි ආකාරය වන්නේ,

1. 
2. 
3. 

49. සෙවණ සහිත ස්ථානයක වැඩෙන ශාකයකි.

1. ගස්ලබු
2. මිරිස්
3. ඇන්තූරියම්

50. 'වරක්කලය' උපකරණය යොදා ගන්නේ,


1. වඩු කර්මාන්තය
2. ධීවර කර්මාන්තය
3. කම්හල් කර්මාන්තය

51. ජල රෝදයේ කරකැවීමේ වේගය වැඩි කිරීමට කළ හැකි දෙයකි.

1. ජල පහරේ වේගය වැඩි කිරීම.
2. ජල පහරේ වේගය අඩු කිරීම.
3. ජල රෝදයේ පෙති ගණන අඩු කිරීම.

52. විෂබීජ නාශකයක් ලෙස බහුලව යොදා ගනියි.

1. කහ 2. ඉඟුරු 3. ලුණු

53. 

මෙම ඇටවුමට චුම්බක ශක්තිය වැඩි කිරීමට කළ හැකි දෙයකි.

1. වියළි කෝෂ ගණන අඩු කිරීම.
2. කොයිල් කම්බි ඔතන ප්‍රමාණය වැඩි කිරීම.
3. කොයිල් කම්බි ඔතන ප්‍රමාණය අඩු කිරීම.

54. ශ්‍රී ලංකාව මුළුමනින් ම ඉංග්‍රීසීන්ට යටත් වූයේ,

1. 1948 2. 1815 3. 1796

55. අධිවේගී මාර්ග දැක්වීම සඳහා භාවිත කරන සම්මත වර්ණය කුමක් ද?

1. දම් 2. නිල් 3. රතු

56. උප්පැන්න හා මරණ සහතික ලියාපදිංචි කරන ආයතනය,

1. ප්‍රාදේශීය සභාව 2. ග්‍රාම නිලධාරී කාර්යාලය
3. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

57. පරිසරයේ ඇති ගස් අතරින් ජල උල්පත් විශාල ප්‍රමාණයක් ආරක්ෂා කරන ගසකි.

1. කුඹුක් ගස 2. මී ගස 3. කොස් ගස

58. 'සුව සැරිය' ගෙන්වා ගැනීමට ඇමතිය යුතු දුරකතන අංකය වන්නේ,

1. 1990 2. 1969 3. 1926

59. මාර්ග ආලෝක සංඥා පුවරුවක රතු පැහැති බල්බය දැල් වී ඇති විට,

1. වාහනය නවත්වන ලෙසයි. 2. වාහනය ධාවනය කරන ලෙසයි.
3. වාහනය ධාවනයට සූදානම් වන ලෙසයි.

(ලකුණු 30)

60. "අපේ ගම ඉතා සුන්දරයි" යන මාතෘකාව යටතේ නිර්මාණාත්මක වැකි **3ක්** ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)

.....

.....

.....

.....

.....

.....

(ලකුණු 6)



සබරගමුව පළාත් ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු සවිය 2026

5 ශ්‍රේණිය



ප්‍රශ්න පත්‍ර අංක 01

I පත්‍රය - පිළිතුරු

ප්‍රශ්න අංකය	පිළිතුර
01	(2)
02	(3)
03	(1)
04	(1)
05	(3)
06	(2)
07	(3)
08	(2)
09	(2)
10	(3)
11	(1)
12	(1)
13	(2)
14	(3)
15	(3)
16	(1)
17	(3)
18	(2)
19	(3)
20	(1)

ප්‍රශ්න අංකය	පිළිතුර
21	(3)
22	(2)
23	(3)
24	(1)
25	(2)
26	(2)
27	(3)
28	(3)
29	(1)
30	(3)
31	(2)
32	(3)
33	(1)
34	(3)
35	(3)
36	(1)
37	(3)
38	(1)
39	(2)
40	(2)

- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි. -